කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

10 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව I , II | කාලය පැය 03

නම : ..............................................................................................

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති 1, 2, 3, 4 උත්තර වලින් නිවැරදි පිළිතුර තෝරන්න.
පහත දැක්වෙන පද්‍ය පාඨ ඇසුරෙන් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අ　අද වෙස්සන්තර රාජ පුතා
　　මන්ද්‍රි කුමාරි බඳි ............... //

ආ　හිටපල්ලා හිටපල්ලා නොගොසින් //

ඇ　විභාගෙ විභාගෙ එහෙ බැලුවත් විභාගෙ මෙහෙ බැලුවත් විභාගෙ

ඈ　ගැ.වෙ ඇඳුරා - දොළහ පෙළපාලියක් කරන්න අවසර ගන්නයි හදන්නෙ

01. පුන්‍යසේන ගුණසිංහ මහතා විසින් නිර්මාණය කරන ලද නාට්‍යයට අයත් පද්‍ය ඛණ්ඩය වන්නේ,
1. අ　2. ආ　3. ඇ　4. ඈ

02. නූර්ති ගීතයට අයත් පද්‍ය ඛණ්ඩය වන්නේ
1. අ　2. ආ　3. ඇ　4. ඈ

03. සෝමලතා සුබසිංහ මහත්මිය විසින් නිර්මාණය කරන ලද ප්‍රසිද්ධ නාට්‍යයක ඇතුළත් පද්‍ය ඛණ්ඩය වන්නේ,
1. අ　2. ආ　3. ඇ　4. ඈ

04. නාඩගම් ආභාසය කර ගෙන නිර්මාණය වු නාට්‍යයකට අයත් පද්‍ය ඛණ්ඩය වන්නේ,
1. අ　2. ආ　3. ඇ　4. ඈ

05. 'ඈ' සංවාදයෙන් නිරූපණය කරන්නේ,
1. සන්නියකුම් යාගයයි　2. සුනියම් යාගයයි　3. කොහොඹා කංකාරියයි　4. රට යකුම් යාගයයි

06. ශ්‍රව්‍ය දෘශ්‍ය සජීවි කලා මාධ්‍යයක් වන්නේ,
1. ටෙලි නාට්‍යය　2. සිනමාව　3. කාටූන්　4. නාට්‍ය

07. නාට්‍යයක් යනුවෙන් හැඳින්වෙන්නේ,
1. කියවා අසා රස විඳීමට තිබෙන දීර්ඝ කතා පුවතකින් යුක්ත වුවකි
2. සිද්ධි අනුපිළිවෙලින් ගොඩ නගන ලද්දකි
3. විශේෂයෙන් තෝරාගත් අවස්ථාවක් හෝ සිද්ධියක් තේමා කරගත් සංවාද ඇතුළත් පෙළකි
4. හේතුඵල සම්බන්ධතාවයක් නොමැති ගොතන ලද කතා පුවතකි

08. චිත්‍ර මූර්ති කැටයම් වැනි කලාවන්ගෙන් නාට්‍ය කලාව වෙනස් වන්නේ
1. ප්‍රේක්ෂක පිරිසක් සිටීම　2. සජීවි සාමූහික කලාවක් වීම
3. දෘෂ්‍ය කලාවක් වීම　4. රසාස්වාදයක් ලැබීම

09. අංග වික්ෂේප භාවිතා කරයි
රිද්මයානුකූල හා ශෝභමාන දෘෂ්‍ය රූපයක් සහිත කලාත්මක නැටුමකි
කිසිදු අර්ථයක් එල නොකරයි
අභිනය භාවිතයක් නොවේ
ඉහත සඳහන් ලක්ෂණ අයත් වන්නේ,

1. නෘත්ත හා නෘත්‍ය 2. නෘත්‍ය හා නාට්‍ය 3. නෘත්ත වල පමණි 4. නෘත්‍ය වල පමණි

10. චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත් වීම හඳුන්වන්නේ,

1. සමාරෝපය 2. අනුකරණය 3. රූපණය 4. අනුරූපණය

පහත දැක්වෙන ප්‍රකාශ පදනම් කරගෙන 11 - 12 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A සබකෝලය දුරු කර ගැනීම
B සාත්වික අභිනය ප්‍රගුණ කර ගැනීම
C ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ හැකියාව වර්ධනය වීම
D ස්මරණ ශක්තිය දියුණු කර ගත හැකි වීම

11. ඉහත සඳහන් ප්‍රකාශ වලට අනුව දර්පණ අභ්‍යාස මගින් නළුවකුට ප්‍රගුණ කර ගත හැක්කේ,

1. A 2. B 3. C 4. D

12. ඉහත සඳහන් ප්‍රකාශ වලට අනුව රංග ක්‍රීඩා තුළින් නළුවකුට ලබාගත හැකි ප්‍රයෝජන වන්නේ,

1. A හා B 2. B හා C 3. C හා D 4. A හා C

13. රංග විධාන අවශ්‍ය වන්නේ,

1. ප්‍රේක්ෂකයන්ට 2. නළුවන්ට 3. ආනුෂංගික ශිල්පීන්ට 4. නාට්‍ය නිෂ්පාදකට

14. මිනිස් සිරුරට සංවේදනයන් ලැබෙන ඉන්ද්‍රියන් ගණන

1. 4 කි 2. 5 කි 3. 6 කි 4. 7 කි

පහත දැක්වෙන වගුව භාවිතයෙන් 15 - 20 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

| A | B | C | D |
|---|---|---|---|
| කුවේණි | අන්දර මල් | පුස්ලෝඩං | එක වල්ලේ පොල් |
| ජනේලය | සිතාම්බර පට | සුභ සහ යස | තට්ටුගෙවල් |
| හුණු වටයේ කතාව | මකරාක්ෂ | සුදු සහ කළු | බෝඩිංකාරයෝ |
| තවත් උදෑසනක් | චරන්දාස් | පණ්ඩුකාභය | නන්දිවිශාල |

15. පරාක්‍රම නිරිඇල්ල , එච් ඒ පෙරේරා සමඟ සම්බන්ධව ආරම්භ කළ ජන කරළිය/ ජංගම රඟ මඩල ආරම්භ කිරීමත් සමඟ නිෂ්පාදනය කළ නාට්‍ය ඇතුළත් වන්නේ,

1. A 2. B 3. C 4. D

16. විජේරත්න වරකාගොඩ හා මානෙල් ජයසේන යන රංග ශිල්පියා හා ශිල්පිනිය දෙදෙනාම රංගනයෙන් දායකත්වය දැක්වූ නාට්‍ය ඇතුලත් වන්නේ,

1. A 2. B 3. C 4. D

17. ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කරන ලද නාට්‍ය කරුගේ නාට්‍ය ඇතුළත් වන්නේ,

1. A 2. B 3. C 4. D

18. D අක්ෂරයෙන් නියෝජනය කරන කාණ්ඩයට අයත් නාට්‍ය නිෂ්පාදනය කරන ලද්දේ,

1. සුගතපාල ද සිල්වා 2. බන්දුල ජයවර්ධන
3. සයිමන් නවගත්තේගම 4. ජැක්සන් ඇන්තනි

19. A කාණ්ඩයට අයත් නාට්‍ය නිර්මාණය කළ නාට්‍ය අධ්‍යක්ෂවරයා වන්නේ,

1. සුගතපාල ද සිල්වා
2. හෙන්රි ජයසේන
3. සයිමන් නවගත්තේගම
4. බන්දුල ජයවර්ධන

20. ශෛලිගත සම්ප්‍රදායෙන් දෛනික ජීවන ප්‍රශ්න නාට්‍යයට නැංවීම දුෂ්කර යැයි පැවති මතයට හෙන්රි ජයසේනයන් විසින් නිර්මාණය කරන ලද නාට්‍ය වන්නේ,

1. අන්දර මල්
2. සුබ සහ යස
3. ජනේලය
4. කුවේණි

21. අංග රචනය යනු

1. චරිතයකට අනුකූලව මුහුණ හැඩ ගැන්වීමයි
2. චරිතයකට අදාල ලෙස වේදිකාව සකස් කිරීමයි
3. චරිතයකට අදාලව සමාරෝපණය වීමයි
4. චරිතයකට අදාලව වේෂ භූෂණ නිර්මාණය කිරීමයි

22. අනුකරණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. නිරීක්ෂණයෙන් තොරව ඉදිරිපත් කිරීමයි
2. පුද්ගල චරිතයක් ක්‍රියාවක් අවස්ථාවක් ඒ අයුරින්ම කර පෙන්වීමයි
3. නිර්මාණාත්මකව මවා ගත් රූපය ප්‍රතිනිර්මාණය කිරීමයි
4. පුද්ගල චරිතයකට ආවේශ වීම හෙවත් ආරූඪ වීමයි

නානුමුරය , සූනියම් යක්ෂණියගේ අවතාර තුන, වඩිග පටුන යන නාට්‍යම පෙළපාලි අන්තර්ගත ශාන්තිකර්ම පිළිවෙලින් දක්වෙන්නේ,

1. සන්නියකුම, සූනියම් යාගය, රට යකුම
2. රට යකුම, සන්නියකුම , සූනියම් යාගය
3. වඩිග පටුන, සන්නි යකුම, නානුමුරය
4. නානුමුරය, සන්නියකුම, වඩිග පටුන

පහත දක්වෙන වගුව ඇසුරින් ප්‍රශ්න අංක 24 සිට 25 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.

| A | B | C |
|---|---|---|
| එදිනෙදා ජීවිතයේ ආයාසයකින් තොරව සිදු කරන චලන | තමාගේ පරිකල්පන ශක්තිය මෙහෙයවා සිදුකරන චලන | නිශ්චිත ගණිතමය රටාවකට අනුව බෙදා වෙන්කළ ක්‍රමයකට අනුව සිදු කරනු ලබන චලන |

24. නිර්මිත චලන ලෙස හඳුන්වනනේ,

1. A
2. B
3. C
4. A,B,C

25. ස්වභාවික චලන ලෙස හැඳින්වෙන්නේ,

1. A
2. B
3. C
4. A,B,C

ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා පහත ඡායාරූප පදනම් කරගෙන පිළිතුරු සපයන්න.


A


B


C


D

26. ඉහත සඳහන් A ඡායාරූපයෙහි සිටින අධ්‍යක්ෂවරයා වන්නේ,

1. මනමේ නාට්‍ය නිර්මාණය කළ එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය
2. කුවේණි නාට්‍ය නිර්මාණය කළ හෙන්රි ජයසේන මහතාය
3. සුබ සහ යස නාට්‍ය නිර්මාණය කළ සුගතපාල ද සිල්වා මහතාය
4. බෙරහඬ නාට්‍ය නිර්මාණය කළ බන්දුල ජයවර්ධන මහතාය

27. විකෘති , තොප්පි වෙළෙන්දා නාට්‍ය නිර්මාණය කරන ලද නිර්මාණ කරු දක්වෙන ඡායාරූපය වන්නේ,

1. A  2. B  3. C  4. D

28. ඉහත සඳහන් ඡායාරූප අතරින් හුණුවටයේ කතාව 'අසඩැක්' ගේ චරිතය රඟපාන ලද්දේ,

1. A  2. B  3. C  4. D

29. 1978 මහාචාර්ය ජොෆ්බව් ජේ මයර් නම් විදේශීය නාට්‍යකරුවාගේ නාට්‍ය වැඩමුළුවේදී ඉදිරිපත් වූ අමල් අබිලික් නාට්‍යයේ රඟපෑමෙන් ක්ෂේත්‍රයට පිවිසිය නාට්‍ය කරුවා වන්නේ,

1. A  2. B  3. C  4. D

30. ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාව දේශීය මුහුණුවරක් කරා යොමු කළ නාට්‍ය කරුවා වන්නේ,

1. A  2. B  3. C  4. D

31. නාට්‍යමය අවස්ථාවක් ලෙස සැලකෙන්නේ,

1. නාට්‍යමය ගුණයෙන් පූර්ණ අවස්ථාවන්ය
2. නාට්‍යයක් ආරම්භ වන අවස්ථාවය
3. නාට්‍යයක් අවසන් වන අවස්ථාවය
4. නාට්‍යයේ ජවනිකා අවසන් වන අවස්ථාවය

32. ''ප්‍රේක්ෂාව ලෙස හැඳින්වෙන්නේ,

1. නාට්‍ය නරඹන තැනැත්තා හඳුන්වන නමයි
2. වේදිකාව මත මොහොතින් මොහොත මැවෙන දර්ශනයයි
3. ප්‍රේක්ෂකයා සන්තෝෂයට පත් කිරීම යනුයි
4. සමාරෝපය යන්නට යෙදෙන තවත් නමකි

33. නාට්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

1. ධනංජය පඬිවරයා  2. නන්දිකේශ්වරය  3. භරතමුනි වරයාය  4. ඇරිස්ටෝටල්ය

34. ක්ෂණික නිරූපනය යනු,

1. ක්ෂණිකව සකසා ගත් පිටපතක් මත ඉදිරිපත් කරන්නකි
2. නිර්මාණාත්මක චින්තනය හා හැකියාව ඇති පාසල් සිසුන් විසින් ඉදිරිපත් කරන ලැබීමකි
3. නිර්මාණාත්මක චින්තනය හා හැකියාව මත වේදිකාවේ ඉදිරිපත් කරනු ලබන්නකි
4. පිටපතකින් තොරව සීමිත කාලයකදී යම් කිසි අවස්ථාවක් නිරූපණය කරන්නකි

35. දරුවන් නොමැති කාන්තාවන් වෙනුවෙන් පවත්වනු ලබන ප්‍රධාන ශාන්ති කර්මය වන්නේ,

1. සන්නියකුම  2. රට යකුම  3. කොහොඹාකංකාරිය  4. සුනියම් යාගය

36. ප්‍රාසාංගික කලා පමණක් අන්තර්ගත වන වරණය වන්නේ,

1. නර්තනය , සංගීතය , මුද්‍රා නාට්‍යය, නාට්‍ය හා ඔපෙරාව
2. මූර්ති ශිල්පය, සංගීතය, නවකතාව, ඔපෙරාව, නාට්‍ය
3. සාහිත්‍යය , නර්තනය, මුද්‍රා නාට්‍ය, සිනමාව සහ නාට්‍ය
4. ඔපෙරාව, චිත්‍ර කලාව, බැලේ, සිනමාව සහ නාට්‍ය

37. තම රූපණය වේදිකාවේදී ඉතා හොඳින් සිදු වූ බවට නළුවාට සතුටට පත්විය හැක්කේ,

1. අධ්‍යක්ෂවරයා ඉන් සෑහීමට පත් වූ විටයි  2. රූපණ ශිල්පියාට තම රූපණය පිළිබඳ ව වැටහී යාමෙනි
3. නළුවා පෙර පුහුණුව ලද වාර ගණන මතය  4. ප්‍රේක්ෂක ප්‍රතිචාරයේ ධනාත්මක භාවය මතය

38. රූපණ ශිල්පියා විසින් ප්‍රගුණ කළ යුතු අංග දෙකක් වනුයේ,

1. මානසික ප්‍රකාශනය හා වාග් ප්‍රකාශනයයි
2. අභ්‍යන්තර ප්‍රකාශනය හා බාහිර ප්‍රකාශනයයි
3. අභ්‍යන්තර ප්‍රකාශනය හා සාත්වික ප්‍රකාශනයයි
4. බාහිර ප්‍රකාශනය හා කථන ප්‍රකාශනයයි

39. නළු නිළියන් වේදිකාවේ අවකාශයෙහි චලන රටා ඇති කරවීම

1. අංග රචනයයි  2. නර්තන රචනයයි  3. වේදිකා රචනයයි  4. රංග රචනයයි

40. අංග රචනය ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් ගණන වන්නේ,

1. 2 යි  2. 3 යි  3. 4 යි  4. 5 යි

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

01.



1. ඉහත සඳහන් ජවනිකාව ඇතුලත් නාට්‍යයේ නම කුමක්ද? (2)
2. මෙම නාට්‍යයෙහි අධ්‍යක්ෂවරයාගේ නම කුමක්ද? (2)
3. මෙම නාට්‍යයෙහි රංග ශෛලිය සකස් කරගෙන ඇත්තේ කුමන ගැමි නාටක ශෛලිය පදනම් කරගෙනද? (2)
4. මෙම නාට්‍යයේ නිරූපිත තේමාව කෙටියෙන් ලියන්න. (2)
5. මෙම නාට්‍ය සඳහා පදනම් කරගත් මූලාශ්‍රය නම් කරන්න. (2)
6. ප්‍රථම වරට මෙම නාට්‍ය රඟ දැක්වූ වර්ෂය කුමක්ද? (2)

02.
1. රංග අභ්‍යාස යනු කුමක්ද? (2)
2. රංග අභ්‍යාස හතරක් නම් කරන්න (4)
3. රංග අභ්‍යාස වලින් නළුවාට අත්වන ප්‍රයෝජන කවරේදැයි විස්තර කරන්න (6)

03.
1. පහතරට සම්ප්‍රදායට අයත් ශාන්ති කර්ම දෙකක් නම් කරන්න (2)
2. ඉන් එක් ශාන්ති කර්මයක නාට්‍යම පෙළපාලි 02 ක් නම් කරන්න (4)
3. නම් කරන ලද නාට්‍යමය පෙළපාලියෙහි අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ පිළිබඳ විස්තරයක් කරන්න(6)

04.
1. අභිනය යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න (2)
2. සතර අභිනය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න (4)
3. රූපණය අර්ථවත්වීම සඳහා සතර අභිනය උපකාරීවන ආකාරය පැහැදිලි කරන්න (6)

05.
1. නාට්‍ය පෙළ යනු කුමක්ද? (2)
2. නාට්‍ය පෙළක් තෝරා ගැනීමේදී නාට්‍ය අධ්‍යක්ෂවරයකු විසින් අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද? (4)
3. නාට්‍ය පෙළක් රංගනයක් බවට පත්වන ආකාරය පියවර වශයෙන් සඳහන් කරන්න. (6)

06.
1. නෘත, නෘත්‍ය, නාට්‍ය යන ප්‍රභේදයන් හඳුන්වන්න (2)
2. කතන්දරයක් හා නාට්‍යයක් අතර වෙනස පැහැදිලි කරන්න. (3)
3. රූපවාහිනී නාට්‍යයන් සහ වේදිකා නාට්‍යයන් අතර ඇති සමාන අසමානතා පැහැදිලි කරන්න (6)

07. පහත සඳහන් කතා සැකිල්ල ඔබ කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

රජ කුමාරියක් මල් උයනක සිරි විඳී. උයනේ ඇති පොකුණක මහනෙල් මල් දැක සතුටින් නෙලා එය සිඹී. ඒ ආඝ්‍රාණයෙන් ඕ සිහිසුන් වෙයි. විලෙන් විරූපී පුද්ගලයෙකු මතුවේ සියලු සේවිකාවෝ දුවයති. විරූපී පුද්ගලයා කුමරිය ස්පර්ශ කරත්ම කුමරිය සිහි ලබයි...................................

1. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය (ල 4) 2. සංවාද සහ රංග විධාන සහිතව පෙළ රචනා කිරීම (ල 8)